කතන්දරයක් කියවමු

ආසියා පැසිෆික් කලාපයෙන් "මැජික් අඹ ගෙඩිය" සහ වෙනත් කථා

ආසියා පැසිෆික් සහ ප්‍රකාශන වැඩ සටහන (ඒසීපී) පෙළ

[illegible] ආ[illegible] සංස්[illegible]තික මධ්‍යස්ථානය

කතන්දරයක් කියවමු

ආසියා පැසිෆික් කලාපයෙන් "මැජික් අඹ ගෙඩිය" සහ වෙනත් කථා.

යුනෙස්කෝ ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය

පෙරවදන

"කතන්දරයක් කියවමු" යුනෙස්කෝ ආසියාතු සංස්කෘතික මධ්‍යස්ථානය විසින් ප්‍රකාශයට පත් කරන ලද "Read Me A Story" නමැති ග්‍රන්ථයේ සිංහල අනුවාදය යි. මෙය රටවල් 20කින් ලබා ගත් කෙටි කතා 32 කින් සමන්විතය. එක් එක් කතා වලින් ඒ ඒ රටවල ජනතාවගේ සිතුම් පැතුම් හා ගති පැවතුම් ආදිය ගැන ළමා පරපුරට යම් කිසි අවබෝධයක් ලැබෙනු නිසැක ය. මේ පොත පරිවර්තනය කිරීමේ දී ළමයාගේ වාං මාලාවට ගැලපෙන සරල භාෂාවක් යොදා ගෙන ඇති බව ද සඳහන් කල යුතුය.

මෙවර යුනෙස්කෝ ආසියාතු සංස්කෘතික මධ්‍යස්ථානය නව මුහුණුවරකින් මෙම ග්‍රන්ථය ළමුන් හට ඉදිරිපත් කර ඇත. මෙය සකස් කොට ඇත්තේ වැඩිහිටියෙකු, ගුරුවරයෙකු හෝ පුස්තකාලයාධිපතිවරයෙකු විසින් ළමයාට හඬ නගා කියවීමේ අරමුණින් ති. මෙහි අරමුණ වී ඇත්තේ කියවීමේ පුරුද්ද හා දරුවා හා වැඩිහිටියන් අතර ඇති සම්බන්ධතාවය නංවාලීම ය.

ඉතා කෙටි කලකින් පරිවර්තන කටයුතු නිම කර දුන් පියවතී ජයසූරිය මහත්මියටත්, සංස්කරණ කටයුතු කරදුන් ස. ජ. සුමනසේකර බණ්ඩා මහතාටත්, මුද්‍රණ කටයුතු මැනවින් ඉටු කරදුන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවටත් අප හෘදයාංගම ස්තුතිය හිමි වේ. මෙවැනි රසවත් කතා එකතුවක් සිංහල බසට පරිවර්තනය කිරීමට අපට අවස්ථාව සලසා දුන් යුනෙස්කෝ ආසියාතු සංස්කෘතික මධ්‍යස්ථානයට ද අපගේ ප්‍රණාමය පුද කරමු.

හිරන්ති වීරසේකර,
නියෝජ්‍ය ලේකම් ජනරාල්.

බත්තරමුල්ලේ,
ඉසුරුපායෙ හි පිහිටි
ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික මණ්ඩලයේ දීය.
03.03.1992

පටුන

පැපුවා නිව් ගිනියාව
මැජික් අඹ ගෙඩිය 9

ඉන්දියාව
මත්ස්‍ය නම් ලස්සන මාළුවා 13

ජපානය
මැජික් බෙරය 19

ඉරානය
ආරාධනා නොකළ අමුත්තෝ 24

නේපාලය
ග්‍යානු සහ බැටළු පැටවා 31

මොන්ගෝලියාව
අනාථ වූ සුදු ඔටුවා 38

ඔස්ට්‍රේලියාව
දේදුනු සර්පයා 43

වියට්නාමය
ගොවියා සහ කොටියා 49

කොරියානු ජනරජය
හැම වැහි දකම ගස්ගෙම්බා කෑ ගසන්නේ ඇයි ? 53

ලාඕස්
කෙළෙහිගුණ නොදත් බල්ලා 57

ම්‍යන්මාව
ෂ්වේ ගජ් නම් ගිරා හාමි 62

නවසීලන්තය
වැඩුණු කේක් ගෙඩිය 67

චීනය
රස්සාවක් සොයා ගිය ඉබි පැංචා 72

ලාඕස්
ගව තාරකා 76

ජපානය
නොපිටට වැඩ කළ හාවා 82

වියට්නාමය
කුකුළු පැටව් සහ නරියා 87

චීනය
කම්මැලි වලස් පැටව් සහ කොමඩු ගෙඩිය 91

පිලිපීනය
නගර - මීයා සහ ගම් - මීයා 95

පකිස්තානය
සිංහයා සහ එළුවා 100

මලයාසියාව
දඩබ්බර මාළු පැටවා 103

ඉන්දුනීසියාව
සහෝදරයන් දෙන්නා යෝධයා මරති 109

චීනය
පලතුරු කන වඳුරා 112

මොන්ගෝලියාව
යගන්දූරන් සහ ඔහුගේ රෝස පාට අශ්වයා 115

නවසීලන්තය
මැක්කෝ 122

ශ්‍රී ලංකාව
අශෝක නම් අශ්ව පැටියා 127

තායිලන්තය
තාත්තාගේ වස්තුව 132

ඔස්ට්‍රේලියාව
බ'ක්ලි ඔයේ බන්යිපාවා 136

කොරියානු ජනරජය
ආත්තම්මා සහ කොටියා 142

බංගලි දේශය
තුන්තුනා සහ තුන්තුනී 147

ඉන්දියාව
අම්මා බලා ගත් ඇත් පැටවා 157

පැපුවා නිව් ගිනියාව
කුස්කුසාවාගෙ කන් දෙකට වුණු දේ 164

ඉරානය
ආච්චි යි සීයා යි 169

පැපුවා නිව් ගිනියාව

මැජික් අඹ ගෙඩිය

ලේඛක

රේ ඔ' පැරල්

චිත්‍ර

මාලන් කුවෙලිනාඩ්

එකමත් එක කාලෙක හුහක් උස අඹ ගහක් මුදුනේ අඹ ගෙඩියක් හටගත්තා. ඒක, අපේ අඹ ගෙඩි වගේ නොවෙයි. අපෝ නෑ ! ඒක මැජික් අඹ ගෙඩියක්. ඒකට හිතන්න පුළුවන්, කතා කරන්න පුළුවන්.

අඹ ගහ මුදුනේ ඉඳලා, මේ මැජික් අඹ ගෙඩියට හුහක් දේවල් දකින්න පුළුවන්. ගහ අද්දර තියෙන ගම්මානය පේනවා. ඈත එපිට තියෙන කඳු පේනවා. ගම්මානෙන් එහා තියෙන මූදත් පේනවා.

"මට මේ ගහෙන් බහින්න ඇත්නම්," කියලා මැජික් අඹ ගෙඩිය හිතුවා. "හැම තැනම ගිහිල්ලා, ඒ තැන් හොඳින් බලා ගන්ට මට ඕනෑ."

ඒ වුනාට, ඒ දුප්පත් අඹ ගෙඩියට ගහෙන් බැහැ ගන්ට බැරි උනා.

දවසක් ඒ අඹ ගහට සුළඟ හරිම තදින් හැමුවා. අඹ ගහේ මුදුන ඒ පැත්තට මේ පැත්තට හෙලවුණා. එක පාරට ම, අඹ ගෙඩිය ගහෙන් වැටුණා – බිමට ම වැටුණා.

මැජික් අඹ ගෙඩියට තුවාලයක් වුණේ නැහැ. ඒක ටිකක් වෙලා තණකොළ බිස්සේ ඉඳලා, මෙහෙම හිතුවා, "මම දැන් ගහෙන් වෙන්වුණා. දැන් ඉතින් මට ලෝකෙ වටේ යන්න පුළුවන්."

මැජික් අඹ ගෙඩිය බිම දිගේ පෙරළී පෙරළී ගියා. කන්ද පහළට පෙරළී පෙරළී ගම්මානය දිහාවට ඇදුණා. ගම්මානය ළඟ දී, මැජික් අඹ ගෙඩියට ඌරෙක් මුණ ගැසුණා.

"ඒයි ! නැවතියන් !" ඌරා කිව්වා. "මට උඹව කාලා දන්ට ඕනෑ !" එතකොට මැජික් අඹ ගෙඩිය හිනා වෙලා, මේ පුංචි සින්දුව කිව්වා –

"මැජික් අඹ ගෙඩියක් වෙමී
තුඹට අල්ලන්නට බැරී
දන්නවද මා යන්නේ කොහිදැ යි
ලෝකයේ හැටි බැලුමට යි !"

මැජික් අඹ ගෙඩිය තව තවත් හයියෙන් පෙරළෙන්න වුණා. ඌරත් ඒ පස්සේ දුව ගෙන ගියා. ගම්මානය කිට්ටුව දී, පුංචි ළමයෙක් අඹ ගෙඩිය දැක්කා.

"ඒයි ! නැවතියන් !" ළමයා කෑගැහුවා. "මට උඹව කන්ට ඕනෑ !" එතකොට මැජික් අඹ ගෙඩිය හිනා වෙලා අර පුංචි සින්දුව ආයෙත් කිව්වා –

"මැජික් අඹ ගෙඩියක් වෙමී
තුඹට අල්ලන්නට බැරී
දන්නවද මා යන්නේ කොහිදැ යි
ලෝකයේ හැටි බැලුමට යි !"

මැජික් අඹ ගෙඩිය තව තවත් හයියෙන් පෙරළෙන්න වුණා. ඌර යි ළමය යි ඒ පස්සෙන් දුවගෙන ගියා.

මිනිස්සු වැඩ කර කර හිටිය ගම්මානෙ වතු පිටි මැද්දෙන් ඒ තුන් දෙනා දිව්වා. ගැනු දෙන්නෙක් ඔළුව උස්සල බැලුවා. මැජික් අඹ ගෙඩිය දැක්කා.

"ඒයි ! නැවතියන් !" ගැනු දෙන්නා කිව්වා. "අපට උඹව කන්ට ඕනෑ !" එතකොට මැජික් අඹ ගෙඩිය හිනා වෙලා අර පුංචි සින්දුව ආයෙත් කිව්වා–

"මැජික් අඹ ගෙඩියක් වෙමි
තුඹට අල්ලන්නට බැරි
දන්නවද මා යන්නේ කොහිදැ යි
ලෝකයේ හැටි බැලුමට යි !"

මැජික් අඹ ගෙඩිය තව තවත් හයියෙන් පෙරළෙන්න වුණා. ඌරා යි ළමය යි ගැනු දෙන්න යි ඒ පිටි පස්සෙන් දිව්වා.

එක පාරට ම බඩගින්නේ හිටි දඩයක්කාරයෙක් ඒ මැජික් අඹ ගෙඩිය දැක්කා.

"ඒයි ! නැවතියන් !" දඩයක්කාරයා කෑගැහුවා. "මට උඹව කන්ට ඕනෑ !"

එතකොට මැජික් අඹ ගෙඩිය හිතා වෙලා අර පුංචි සින්දුව ආයෙත් කිව්වා –

"මැජික් අඹ ගෙඩියක් වෙමී
තුඹට අල්ලන්නට බැරී
දන්නවද මා යන්නේ කොහිදැ යි
ලෝකයේ හැටි බැලුමට යි !"

මැජික් අඹ ගෙඩිය තව තවත් හයියෙන් පෙරළෙන්න වුණා. ඌරයි ළමය යි ගෑනු දෙන්න යි දඩයක්කාරය යි අඹය පිටි පස්සෙන් දිව්වා.

නවතින්නේ නැතුව ඔක්කොමලා මෙහෙම දිව්වා. අන්තිමට මැජික් අඹ ගෙඩියට මහන්සි දැනුණා.

මහන්සි දැනිලා මහන්සි ඇර ගන්න තැනක් සොයා බැලුවා. උසට වැඩිච්ච තණකොල ගොන්නක් අස්සට ඒක පෙරළී ගිහින් ඒ අස්සේ හැංගුණා. ඌරට ත් ළමයට ත් ගෑනු දෙන්නට ත් දඩයක්කාරයට ත් අඹ ගෙඩිය සොයා ගන්නට බැරි වුණා. ඉතින් ඒ ඔක්කොම විගහට ආපහු ගෙදර ගියා.

මැජික් අඹ ගෙඩියට හරි ම මහන්සි යි. ඉතින් අඹ ගෙඩිය නිදා ගත්තා. දවස් ගණනක් ම නිදා ගත්තා. නින්දෙන් නැගිට්ටාම හොඳට අව්ව පායලා හරි ම සනීප යි උණුසුම යි. "මට හිතෙනවා මෙතන ටිකක් වෙලා ඉන්ට," මැජික් අඹ ගෙඩිය හිතුවා.

ඔහොම කලක් ගත වුණා. එක දවසක් මැජික් අඹ ගෙඩියෙන් කොළ පාට පුංචි රිකිළි වැඩෙන්නට පටන් ගත්තා.

මොකද වුණේ කියලා ඔයාලට හිතා ගන්න පුළුවන් ද ? ඔව්, මැජික් අඹ ගෙඩිය දැන් පැළවෙලා ගහක් වෙන්න හදනවා !

ඉන්දියාව

මත්ස්‍ය නම් ලස්සන මාළුවා

ලේඛක

ශාන්ත රාමේෂ්වර් රාඕ

විත්‍ර

මෘනාල් මිත්‍රා

මහ මුදේ, මත්ස්‍ය කියලා ලස්සන මාළුවෙක් ජීවත් වුණා. අපට හොඳින් බලා ගන්න බැරි තරම් ඌ හරි ම පුංචි යි. ඒ වුණාට, මුළු ලෝකේ ම, ඌ තමයි ඉතාම සන්තෝසෙන් හිටිය මාළුවා. එහෙම ඉන්න කොට, එක දවසක් ලොකු, නපුරු මාළුවෙක් ඌ දැකලා මෙහෙම හිතුවා, " අර මාළුවා හරි ම චූටි යි. ඔව්, එයාව කෑමට නම් අගෙයි. "

ලොකු මාළුවා මත්ස්‍ය පස්සේ එළෙව්වා. නමුත් මත්ස්‍ය වතුරෙ යටින් කිමිදිලා මුදු පැලෑටි අස්සෙ යි ගල් අස්සෙ යි හැංගුණා. මත්ස්‍ය දක්ෂ වුණාට හරියට ම බය වුණා.

තවත් දවසක, දිගටි උල් දත් තියෙන මාළුවෙකුට මත්ස්‍ය අහුවෙන්න ගිහින් යම්තමින් පණ බේරා ගත්තා.

" අනේ, මං මොනවා ද දැන් කරන්නේ ? ලොකු මාළුවො මාව කන්ට හදනවා. මට ඕනැ නෑ ඒගොල්ලන්ට බිලි වෙන්ට. මට ඕනැ ජීවත් වෙන්ට – සෙල්ලම් කරන්ට – ලොකු වෙන්ට. බේරිලා ඉන්ට විදියක් මං හොයා ගන්ට ඕනැ, " මත්ස්‍ය හැඬුවා.

මූදු වෙරළට එන කල් ම මත්ස්‍ය පීනගෙන පීනගෙන ආවා.

එතන දි එයාට "මනු " කියන මාළුකාරයා මුණ ගැහුණා. මත්ස්‍ය, එයාගේ කතාව මනුට කිව්වා.

"මං මහ මුදෙ තවත් හිටියොත් සත්තකින් ම මං මැරෙයි", මත්ස්‍ය කිව්වා.

"අපෝ, එහෙම මැරෙන්ඩ ඉඩ දෙන්ට හොඳ නෑ !" මනු කිව්වා. තමන්ගේ අල්ල බොකුටු කරලා, පීනන්න වතුර ටිකකුත් එක්ක මනු මත්ස්‍යාව ගත්තා.

දැන් මත්ස්‍ය කලින් වගේ සන්තෝසෙන් ඉන්නවා. මනුගෙ අඹුව මනුෂි මත්ස්‍යාව වතුර භාජනයකට දැම්මා – මනුගෙ ළමයි මත්ස්‍යාව බලා ගන්ට උදව් වුණා.

හැම දම මනු මත්ස්‍යාට කන්න දුන්නා. මත්ස්‍ය එන්න එන්න ලොකු වුණා ; හොඳට ශක්තිමත් වුණා ; ඥානවන්ත වුණා ; තව තවත් ලස්සන වුණා.

එක දවසක් භාජනය පිරෙන තරමට ම ලොකු වුණා.

එත කොට, මනුගෙ මුළු පවුල ම එකතු වෙලා, මත්ස්‍යට පොඩි පොකුණක් හදලා දුන්නා. පොකුණේ වතුරෙ, ඕළු, මානෙල් පඳුරු අස්සේ මත්ස්‍ය පීනුවා.

දවසින් දවස මත්ස්‍ය එන්න එන්න ලොකු වුණා ; හොඳට ශක්තිමත් වුණා ; ඥානවන්ත වුණා ; තව තුවත් ලස්සන වුණා. එක දවසක් මුළු පොකුණ පිරෙන තරමට ම ලොකු වුණා.

එතකොට මනුගෙ අඹුව-මනුෂි, මත්ස්‍යව ගඟට දැම්මා. ගඟ හරි ගැඹුරු යි- හරි පළල යි. මත්ස්‍ය ගඟේ පීන පීනා සෙල්ලම් කළා. හැම දම ඌ ලොකු වුණා ; හොඳට ශක්තිමත් වුණා ; ඥාණවන්ත වුණා ; හුඟක් ලස්සන වුණා.

ඔහොම ඉතින් කාලය ගෙවී ගියා.

දවසක් මනුගෙ මුළු පවුල ම මත්ස්‍ය බලන්න ආවා. මත්ස්‍ය උඩට පීනලා හෙණ හඬ වගේ මහ හයියෙන් මෙහෙම කිව්වා, " මේ අහන්ඩ ! මහ විපත්තියක් වෙන්ට යි යන්නේ. ගඟ උතුරලා මහ ගංවතුරක් එනවා. වලාකුළු යි වැස්ස යි පිරිලා ගං වතුර පොළොව උඩින් කඩාගෙන බිඳගෙන යනවා. ගෙවල් කඩා වැටෙයි. වතු පිටි කුඹුරු ගංවතුරෙන් යටවෙයි. "

" අපට බේරිලා ඉන්ට විදියක් නැද්ද ? " යි මනු ඇහුවා.

" මං කියන්නම් කරන්ට ඕනැ දේ. ඔය ඇත්තො යාළුවොත් එක්ක එකතු වෙලා පාරුවක් හදන්ට. ඒක ඇතුළෙ බේරිලා ඉන්ට පුළුවනි, " මත්ස්‍ය කිව්වා.

මත්ස්‍ය කියූ දේ මනුත් මනුෂිත් යාළුවන්ට කීවාම යාළුවො හිනා වුණා. " බොරු කියන්නෙ නැතුව යනවා. අපි ඔය මෝඩ කතා අහන්නෙ වත් පාරු හදන්නෙ වත් නෑ " යාළුවො කිව්වා.

ඉතින් මනුගෙ මුළු පවුල ම එකතු වෙලා, වෙහෙස මහන්සි වෙලා, තනියම පාරුවක් හද ගත්තා.

ටික කාලෙකට පස්සෙ, මත්ස්‍යා කියූ විදියට ම මහ ලොකු ගංවතුරක් ආවා. කළු වලාකුළුවලින් ඉර වැහිලා ගියා. වැස්ස වැටුණා, විදුලි කෙටුවා, හෙණ ගැහුවා, වැහැලා, වැහැලා, වැව්, පොකුණු, ගංගාවල් පිරිල ඉතිරිලා ගියා. පොළොව උඩින් ගං වතුර තදින් ගහගෙන ගියා. ගෙවල් කැඩිලා වැටුණා. කුඹුරු යටවුණා.

"අපිව බේරා ගනියෝ", "අපි ගිලෙනවෝ, අපේ හරක බාන ගිලෙනවෝ, ඔක්කෝම ගිලෙනවෝ, අපිව බේරා ගනියෝ" කියමින් මිනිස්සු කෑ ගැහුවා. මනුගෙ මුළු පවුල විතරක් බේරිලා පාරුව ඇතුළෙ ඉඳගෙන හිටියා.

"පාරුවෙ දොර ඇරලා අපිටත් එන්ට දෙන්ට- නැත්නම් අපි ඔක්කොම ගිලිලා මැරේවි", යි මිනිස්සු පිංසෙන්ඩු වුණා.

ඉතින් මනු දොරවල් ඇරියා. යාළුවො සේරම පාරුව ඇතුලට ආවා.

එතකොට සත්තුයි කුරුල්ලොයි සේරම කෑගසන්න පටන් ගත්තා, "අනේ, අපිවත් ඇතුළට ගන්ට, මනු." ඉතින් මනු ඒ අයත් ඇතුළට ගත්තා. ඒ විදියට දින ගණන් ගත වුණා. දින, සති වුණා. පාරුව ගංවතුරෙ පැද්දි පැද්දි පා වුණා. කිසි ම ගොඩ බිමක් දැන් පෙනෙන්නට නැහැ. හැම දම පාරුවෙන් පිටතට එබී බැලුවත් වතුර මිසක් වෙන කිසි ම දෙයක් දකින්ට ලැබුණේ නැහැ.

මාස ගණනක් ගෙවී ගියා. හැම දෙනා ගැන ම මනුගෙ මුළු පවුල ම බලා ගත්තා. "බය වෙන්ට එපා," මනු ඔවුන්ට කිව්වා.

එක දවසක්, පුංචි කුරුල්ලෙක් ජනේලයෙන් පිටත බැලුවා ම මොකක් දෝ ලොකු දිලිසෙන, ලස්සන දෙයක් වතුරෙ තියෙනවා දැක්කා.

"අන්න බලනවා, " කුරුල්ලා කෑගැසුවා. "අන්න, ලොකු විශාල මාළුවෙක් ගංවතුරෙ පීනගෙන එනවා. "

"ආ ඒ මත්ස්‍ය නේ. එයා හරියට ලොකු වෙලා, කඳුවලටත් වැඩිය ලොකු වෙලා."

"මත්ස්‍ය, මත්ස්‍ය, අපිව ඇවිත් බේරාගන්ට. " හැමෝ ම කෑගැසුවා.

මත්ස්‍ය පීනගෙන ළඟට ආවා. එයාගෙ ඔලුව මුදුනේ අඟක් තිබුණා. "මගෙ අඟට පාරුව ගැට ගහන්ට. එත කොට මං ඔය කට්ටිය ගොඩට ගෙන යන්නම්, " ගෙරවිලි හඬින් මත්ස්‍ය කිව්වා.

දවස් ගණනක් තිස්සේ මත්ස්‍ය පාරුව ඇද ගෙන ගියා. එත කොට වැස්ස පායන්ට පටන් ගත්තා. ගංවතුර බැහැගෙන ගියා. කට්ටිය ම දූපතක් ළඟට ආවා. "ඔන්න මං ඔය ඇත්තො මේ දූපතට පරෙස්සමෙන් අරන් ආවා. දැන් මේ දූපතේ ජීවත් වෙන්ට පුළුවන් " මත්ස්‍ය කිව්වා.

එත කොට හැමෝ ම පාරුවෙන් ගොඩට බැස්සා.

"මත්ස්‍ය කෝ ? " පොඩි ළමයෙක් ඇසුවා. "මත්ස්‍ය ගියේ කොහේ ද ? හැමෝ ම විපරම් කළා.

ඈත, ඈත, එපිටින් මත්ස්‍යගේ කටහඬ ඇහුණා." මගේ ගෙදර මහ මුද යි. මං ආවෙත් එහෙන් – ආපහු යන්ට ඕනැත් එහාට".

"මත්ස්‍ය, ආපහු එන්ට, ආපහු එන්ට. ලස්සන මත්ස්‍ය, අපව දල යන්ට එපා, " මිනිස්සු කෑගැසුවා.

ඈත, ඈත, එපිටින් මත්ස්‍ය පිළිතුරු දුන්නා, "මං ආපහු එන්නම්. ඒත් – දැන් නෙමේ, දැන් නෙමේ, දැන් නෙමේ, කවද හරි මාව ආයෙත් ඕනෑ වෙන කොට මං ආපහු එන්නම්. ඔන්න මං පොරොන්දු වෙනව".

එහෙම කියලා, මත්ස්‍ය පුංචි වෙලා, පුංචි වෙලා, අන්තිමට මහ මුදේ නොපෙනී ගියා.

ජපානය

මැජික් බෙරය

ලේඛක

මොමොකො ඉෂිඉ

චිත්‍ර

කොන් ෂිම්සු

එකමත් එක කාලෙක, ජපන් ගම්මානෙක ගෙන්ගොරෝ කියලා මිනිහෙක් හිටියා. ගෙන්ගොරෝට මැජික් බෙරයක් තිබුණා. "නහය දික් වේවා, නහය දික් වේවා", කියලා බෙරේ එක පැත්තකට ගැහුවා ම නහය දික් වෙනවා. "නහය කෙටි වේවා, නහය කෙටි වේවා" කියලා අනික් පැත්තට ගැහුවා ම නහය කෙටි වෙනවා. මේ බෙරය නිකම් සෙල්ලමට ගහන්න හොඳ නැහැ. මිනිස්සු සතුටු කරන්ට යි ඒක තිබුණේ.

නහය ටිකක් දික් කරගන්නට ඕනෑ මිනිසුන්ට හරි නහය ටිකක් කොට කර ගන්ට ඕනෑ මිනිසුන්ට හරි ගෙන්ගොරෝ මේ බෙරේ ගහලා, ඒ අය සතුටු කළා.

ගෙන්ගොරෝ නොයෙකුත් දේ ගැන දැන ගන්න හරි ම ආස යි. කල් යන්ට, යන්ට, ගෙන්ගොරෝ කල්පනා කරන්න පටන් ගත්තා, මිනිසකුගෙ නහයකට කොයි තරම් දික්වෙන්නට පුළුවන් ද කියලා. එක දවසක් ගෙන්ගොරෝ බෙරෙත් අරන් වෙළට ගියා. "මගේ නහය දික් වේවා, මගේ නහය දික් වේවා," කිය කියා, බෙරය ගහන්නට පටන් ගත්තා – ඩෙං – කුටු ඩෙං– කුටු.

එක පාරට ම ගෙන්ගොරෝගේ නහය දික් වෙන්නට පටන් ගත්තා. ටික වේලාවක් ගත වෙන්නට කලින් ඔහුගේ නහය ඔහුගේ අත් තරමට දික්වුණා. ඩෙං–කුටු, ඩෙං–කුටු ගෙන්ගොරෝ බෙරය ගහන අතරේ "මගේ නහය දික්වේවා, මගෙ නහය දික්වේවා," කිව්වා.

ඔහුගෙ නහය රිටක් තරම් දිගට දික්වුනා. ඒත් ගෙන්ගොරෝ තෙමේ බෙර ගැහිල්ල නැවැත්තුවේ. "මගේ නහය දික්වේවා. මගේ නහය දික්වේවා. " කිය කියා ඔහු දිගට ම බෙර ගැහුවා.

ඔහුගේ නහය ඉක්මනින් ම රෙදි වේළන ලණුවක් තරම් දික් වුණා. ඔහුට කකුල් දෙකින් හිට ගෙන ඉන්න බැරි තරමට නහය බර වුණා. ඉතින් ඔහු අහසට මුහුණ ලා ගෙන බිම දිගා වුණා. ඒත් බෙර ගැහිල්ල නැවැත්තුවේ නම් නැහැ.

ඩෙං – කුටු, ඩෙං – කුටු – "මගෙ නහය දික්වේවා, මගෙ නහය දික්වේවා."

ඔහුගෙ නහය දික්වෙවී, දික්වෙවී ගියා. ගස්වලටත් වැඩිය උසට දික්වුණා, කඳුවලටත් වැඩිය උසට දික්වුණා. අන්තිමට නහයෙ තුඩ, සුදු වලාකුළක් අස්සෙ නොපෙනී ගියා.

හරියට ම ඒ වෙලාවෙ, දිව්‍යලෝකෙ වඩු–බාස්ලා එකතු වෙලා අහස් ගඟ හරහා පාලමක් හද හදා හිටියා. වයසක වඩු බාස් කෙනෙක් පාලමේ බාල්කයක් හයි කරමින් හිටියා. ගෙන්ගොරෝගෙ නහය හරියට ම එතනින් උඩට මතු වුණා. බාස් උන්නැහේ හිතුවා ඒක ඔහු පාවිච්චි කරමින් හිටිය රිටක් කියලා. ඉතින් ඔහු ලණුවක් අර ගෙන ගෙන්ගොරෝගෙ නහය පාලමේ බාල්කයට තියලා හොඳ හයියට ගැට ගැහුවා.

ඒත් ගෙන්ගොරෝ ඉන්නෙ කොහේ ද ? බිම, ඔහුගෙ නහයෙ අමුතු ගතියක් ඔහුට දැනුණා. ඔහු දිගට ම බෙරය ගැහුවට, ඔහුගෙ නහය ඊට වඩා දික්වුණේ නැහැ. ඒ විතරක් ද – ඔහුට නහය අගිස්සෙ කැසිල්ලක් ඇති වුණා.



"මම මගෙ නහය කොට කර ගෙන, මොකද වෙලා තියෙන්නෙ කියලා බලා ගන්ට ඕනෑ," ගෙන්ගොරෝ ඔහුට ම කියා ගත්තා. මේ වතාවෙ ඔහු, "මගේ නහය කොට වේවා, මගේ නහය කොට වේවා," කිය කියා බෙරේ අනික් පැත්තට ගැහුවා.

ඒ වුණාට – අපොයි ...... මතක ද ගෙන්ගොරෝගෙ නහය අර පාලමේ බාල්කයට ගැට ගහලා තිබුණ වික්තිය ? ඉතින්, ඔහුගෙ නහය කොට වන්නට පටන් ගත්තා ම, නහය පහළට ඇදිලා එන්නෙ නැතුව, මුළු ඇඟම උඩට ඇදිලා ගියා

"අපොයි දෙයියනේ කවුදෝ මගෙ නහය හොරකම් කරන්ට හදනවා. කෝ – ඉක්මන් කරන්ට ඕනෑ," ඔහු කෑගහලා කිව්වා. ඩොං – කුටු, ඩොං - කුටු, ඩොං – කුටු .... පුළුවන් තරම් බෙර ගැහුවා.

අන්තිමට ඔහු දිව්‍ය ලෝකෙට ගියා ම අහස් ගඟ පැත්තෙ කවුරු වත් පේන්නට හිටියෙ නැහැ. ඉර මුදුන් වෙලා තිබුණ හින්දා බාස් උන්නැහැලා ඔක්කොම දවල් කෑමට ද කොහෙ ද ගෙදර ගිහින්. ගෙන්ගොරෝට සොයා ගන්නට පුළුවන් වුණා ඔහුගෙ නහයට කරලා තිබුණ දේ ගැන.

"මදෑ මගෙ නහය කවුද රිටකට අර ගෙන නේ. මොන මෝඩ මිනිහෙක් ද ඒ " ඔහු කිව්වා. ඔහු නහයෙ බැම්ම ලිහලා, නහය හොඳ හැටි අතගා ගත්තා.

එතකොට ඔහු ට යම්තම් සතීප දැනුණා. ඒත් ඔහුගෙ දිග නහය නැතුව ආපහු පොළොවට යන්නෙ කොහොම ද ? ඔහු කර කියා ගන්න දෙයක් නැතිව පාලමෙන් පහළට බැලුවා.

හරියට ම ඒ මොහොතෙ, පාලම යට තිබුණු සුදු වළාකුළ දෙබෑ වුණා. ඒ අතරෙන් ඔහු දැක්කා හුහක් පහළ තියෙන තිල්පාට වැවක්. එක පාරට ම ඔහුගෙ හිසේ කැරකිල්ලක් ඇති වුණා.

"ඌ...... හ්" ඔහු පාලමෙන් වැටුණා. ආකාසෙ පීරගෙන මුනින් අතට පහළට වැටුණා.

ඔමි රටේ, බිවා වැව කියන විශාල වැවකට ගෙන්ගොරෝ වැටුණා. ඔහු පීනන්නට හුහාක් වෙර වැයම් දැරුවා. ඒත් ඔහුට පීන ගන්නට බැහැ. ඔහුගේ ඇඟට මොකක් දෝ වෙලා වගේ. ඔහුගේ අත් නැති වෙලා – කකුල් නැති වෙලා. ඒ වෙනුවට ඔහුට දැන් පුංචි වරලකුත් වලිගයකුත්

ඇවිල්ලා. ඔහුගේ කටත් නහයත් උල් වෙලා – හරියට මාළුවකුගෙ වගේ. ඔව්, ඔහු මාළුවෙක් වෙලා.

තිකම් සෙල්ලමට බෙරේ ගහන්නට ගිහිල්ලා ගෙන්ගොරෝට සිද්ධ වුණු දඬුවම තමා ඒ. අද වුණත් බිවා වැවට ගියොත්, ඒ වගේ පුංචි මාළු හුඟක් දකින්නට පුළුවන් වේවි. ඒ මාළුන්ට කියන්නේ ගෙන්ගොරෝ – මාළු[1] කියලා.

1. ගෙන්ගොරේ – මාළු : දිය කුරුමිණි වර්ගයක්

ඉවනාමි ෂොටෙන් ප්‍රකාශකයන් විසින් ප්‍රකාශිත 'පිෂිගි න කයිකො' පොතෙනි.